ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

පුවත්පත් නිවේදනය

කුසලතා වර්ධන ක්ෂේත්‍රය තුළ ඉන්දියා - ශ්‍රී ලංකා සහභෝගීතාවය ඉහළ නංවමින් "වසංගත කාලයන්හි පොලිස් කටයුතු" යන මැයෙන් පැවති e-ITEC අන්තර්ජාල සම්මන්ත්‍රණය

ඉන්දියාවේ විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් ඉන්දියානු තාක්ෂණික සහ ආර්ථික සහයෝගීතාවයේ (e-ITEC) සහකාර රාජ්‍යයන් සඳහා පවත්වනු ලබන අන්තර්ජාල සම්මන්ත්‍රණ මාලාවේ තවත් පියවරක් ලෙස නව දිල්ලියේ පොලිස් පර්යේෂණ සහ සංවර්ධන කාර්යාංශය විසින් "වසංගත කාලයන්හි පොලිස් කටයුතු" යන මැයෙන් සංවිධානය කරන ලද අන්තර්ජාල සම්මන්ත්‍රණයක් 2020 අගෝස්තු 10 හා 11 යන දෙදින තුළ පැවැත්විණ. රටවල් 25කින් නියෝජිතයන් 97 දෙනෙකු මෙම සම්මන්ත්‍රණයට සහභාගී විය. අම්පාර නියෝජ්‍ය පොලිස්පති වී. ජී. ඩී. අයස කරුණාරත්න, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ඒ. එල්. යූ. එන්. ප්‍රියන්ත ලියනගේ සහ සහකාර පොලිස් අධිකාරී කේ.ටී. නිමිල ද සිල්වා යන මහත්වරුන් ඇතුළු ශ්‍රී ලංකා පොලිස් නිලධාරීන් දස දෙනෙකු මෙම සම්මන්ත්‍රණයට සහභාගී වූහ.

ඉන්දීය රජයේ ස්වදේශ කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍ය ගරු ශ්‍රී කිෂාන් රෙඩ්ඩි මැතිතුමා මෙම දෙදින සම්මන්ත්‍රණය සමාරම්භ කළේය. ඉන්දීය පොලිස් සේවයේ විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නිලධාරීන් මානව පොලිස් කටයුතු, කාන්තාවන් සහ දරුවන් සම්බන්ධයෙන් වන පොලිස් කටයුතු, ප්‍රජාව වෙත ළඟා වීම, ආතතිමය කාලයන්හි පොලිස් කටයුතු සිදු කිරීම සහ ඵලදායි පොලිස් කටයුතු සඳහා බුද්ධි තොරතුරු යොදා ගැනීම යනාදි විවිධ මාතෘකා ඔස්සේ සම්මන්ත්‍රණයට සහභාගී වූවන් දැනුවත් කළේය.

ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය සෞඛ්‍යය, යහ පාලනය සහ පොලිස් කටයුතු යන ක්ෂේත්‍රයන්හි e-ITEC විසින් සංවිධානය කරන ලද විවිධ කටයුතු සඳහා ශ්‍රී ලාංකික නිලධාරීන් විසින් දැක්වූ ක්‍රියාශීලී සහභාගීත්වය අගය කරයි. ශ්‍රී ලංකා යුධ හමුදා මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් එච්. ජේ. එස්. ගුණවර්ධන මහතා 2020 ජූනි 18-19 දෙදින මුසූරි හි යහ පාලනය සඳහා ජාතික මධ්‍යස්ථානයේදී "කොවිඩ්-19 - වසංගත කාලයකදී යහ පාලන පිළිවෙත්" යන මැයෙන් පවත්වන ලද සමුළුව 2020 ජූනි 18-19 දෙදින සහභාගී වෙමින් වසංගතය පාලනය කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ අත්දැකීම් සහ මනා පිළිවෙත් බෙදා හදා ගත්තේය.

****

කොළඹ
ශක වර්ෂ 1942 ශ්‍රාවණ 21
2020 අගෝස්තු 12